සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

11 ශ්‍රේණිය | අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2018 | 61 S I

# භූගෝල විද්‍යාව I

කාලය පැය 01 යි

**සැලකිය යුතුයි.**
* ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 40කින් සමන්විතයි.
* එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස් වලට අනුකූලව සියලුම ප්‍රශ්න වලට මෙම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන්න.

*** අංක 01 සිට 10 දක්වා ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැලපෙන පිළිතුර වරහන් තුලින් තෝරා තිත් ඉර මත ලියන්න.**

(01) පෘථිවි ව්‍යුහයේ ....................... සියැල් හා සිමැග් යන ස්ථර දෙකකින් සමන්විතවේ. (කබොල/ ප්‍රාවරණය/ හරය)

(02) පරිවර්තී ගෝලය තුළ සිදුවන පරිසර පතන සීඝ්‍රතාව වායුගෝලයේ ඉහළ යන සෑම මීටර් 100කටම.................. බැගින් උෂ්ණත්වය අඩුවෙයි. ($0.064^0C$/ $0.64^0C$/ $6.4^0C$)

(03) පරිසරයේ අජෛව සාධකයක් ලෙස .......................... හැඳින්විය හැකියි. ((ශාක/ වියෝජකයන්/ දේශගුණය)

(04) නැගෙනහිර ආසියාතික රටවල් .................................................................... භූ තැටියේ පිහිටා ඇත. (යුරේසියානු/ ඉන්දු - ඕස්ට්‍රේලියානු/ පැසිපික්)

(05) කර්කටක නිවර්තනය හා ආක්ටික් වෘත්තය අතර ......................... දේශගුණික කලාපය පිහිටා ඇත. (ශීත/ සෞම්‍ය/ නිවර්තන)

(06) කුරුණෑගල, බදුල්ල, මාතලේ වැනි දිස්ත්‍රික්ක වල ව්‍යාප්ත වී බිම් .................... කලාපයට අයත් වේ. (වියළි/ තෙත්/ අතරමැදි)

(07) මන්නාරම, පුත්තලම වැනි දිස්ත්‍රික්ක වල ....................... වගාව සරුවට සිදුකෙරේ. (කුරුඳු/ පැගිරි/ කජු)

(08) .......................... ක්ෂය නොවන සම්පතක් ලෙස සැලකිය හැකියි. (සූර්යාලෝකය/ පස/ වනාන්තර)

(09) ශ්‍රී ලංකා භූමියෙන් දැනට සොයාගත නොහැකි පාෂාණ වර්ගයක් වන්නේ, ................................... පාෂාණය. (ආග්නේය/ අවසාධිත/ විපරීත)

(10) ශ්‍රී ලංකා 1:50,000 භූලක්ෂණ සිතියම් වල පරිමානය ............................................................ දක්වා ඇත. (ඉහළ වටතීරුවේ/ පහළ වටතීරුවේ/ ඇතුළු මායිම් තීරුවේ.)

*** අංක 11 සිට 15 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය කියවා බලා නිවැරදි නම් "නි" යන්න වටා ද වැරදි නම් "වැ" යන්න වටා ද රවුමක් අඳින්න.**

(11) භූ තැටි චලනයට අවශ්‍ය බලය භූ අභ්‍යන්තරයේ ක්‍රියාත්මක තාප සංවහන ධාරා වලින් සපයයි. නි/වැ

(12) වායුගෝලීය සංයුතියෙන් 78%ක් පමණ ඇත්තේ හයිඩ්‍රජන් වායුවයි. නි/වැ

(13) උතුරු ඇමරිකාවේ සැක්‍රමැන්ටෝ නිම්නය වී වගාවට ප්‍රසිද්ධ ය. නි/වැ

(14) සුළු අපනයන භෝග පර්යේෂණ ආයතනය ගන්නෝරුවේ පිහිටා ඇත. නි/වැ

(15) "ලැව්ගිනි" ජීව විද්‍යාත්මක උපද්‍රවයක් ලෙසද සලකයි. නි/වැ

*** අංක 16 සිට 20 තෙක් දී ඇති ප්‍රශ්න වල "අ" සහ "ආ" තීරු දෙකක් දැක්වේ. ඒවා සම්බන්ධතාව අනුව ගැලපූ විට නිවැරදි පිළිතුරට හිමි අංකය තිත් ඉර මත ලියා දක්වන්න.**

(16) ඛනිජ සම්පත "අ" තීරුවේ දක්වා ඇති අතර, එය පිහිටි ප්‍රදේශය "ආ" තීරුවේ දක්වා ඇත. නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර,

| "අ" | | "ආ" |
|---|---|---|
| 1. කෙඔලින් | A | රාගෙදර |
| 2. මිනිරන් | B | නිලාවේලි |
| 3. සිලිකාවැලි | C | මීටියාගොඩ |
| 4. ඛණිජ වැලි | D | හලාවත |

1. DCBA  2. CADB  3. CABD  4. BACD (............)

(17) "අ" තීරුවේ විදුලි බලාගාර පිහිටි ප්‍රදේශය දක්වා ඇති අතර, "ආ" තීරුවේ දක්වා ඇත්තේ අදාළ බලශක්ති මූලයයි. නිවැරදිව ගලපා පිළිතුර තෝරන්න.

| "අ" | | "ආ" |
|---|---|---|
| 1. බෝවතැන්න | A | සූර්යශක්තිය |
| 2. නොරොච්චෝලේ | B | ජලය |
| 3. පුත්තලම | C | ගල්අඟුරු |
| 4. ගොන්නෝරුව | D | සුළං |

1. DCAB  2. ACBD  3. BCAD  4. BCDA (............)

(18) ශ්‍රී ලංකාවේ අධිවේගී මාර්ග කීපයක් "අ" තීරුවේ දක්වා ඇති අතර, එම මාර්ග සඳහා දී ඇති මාර්ග අංක "ආ" තීරුවේ දක්වා ඇත. නිවැරදිව ගලපා පිළිතුර තෝරන්න.

| "අ" | | "ආ" |
|---|---|---|
| 1. කොළඹ - මාතර මාර්ගය | A | E03 |
| 2. කොළඹ - කටුනායක | B | E02 |
| 3. කොළඹ - පිටරවුම | C | E01 |

1. ABC  2. CAB  3. CBA  4. BCA (............)

(19) ආපදා කළමණාකරණ චක්‍රයේ අවස්ථා "අ" තීරුවේ දක්වා ඇත. එම අවස්ථාවල ගත යුතු ක්‍රියාමාර්ග අංක "ආ" තීරුවේ දක්වා ඇත. නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| "අ" | | "ආ" |
|---|---|---|
| 1. පෙර සූදානම | A | ගොදුරුවූවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම. |
| 2. ප්‍රතිචාර දැක්වීම | B | ආපදාවේ පූර්ණ ලක්ෂණ හඳුනා ගැනීම. |
| 3. යථාතත්වයට පත්කිරීම | C | ප්‍රජාව දැනුවත් කිරීම. |
| 4. අවම කිරීම | D | පරිසරය පුනරුත්තාපනය කිරීම. |

1. BCDA  2. BADC  3. CABD  4. ABCD (............)

(20) ශ්‍රී ලංකා 1:50,000 භූලක්ෂණ සිතියම් වල භාවිත සංකේත කීපයක් පහත "අ" තීරුවේ දක්වා ඇති අතර, එම සංකේත මගින් නිරූපිත ලක්ෂණය "ආ" තීරුවේ දක්වා ඇත. නිවැරදිව ගලපා පිළිතුර තෝරන්න.

| "අ" | | | "ආ" |
|---|---|---|---|
| 1. ✶ | (කළු) | A | සංචාරක බංගලාව |
| 2. ▲ | (කළු) | B | උසාවිය |
| 3. △ | (අවර්ණයි) | C | පොලීසිය |
| 4. ✡ | (රතු) | D | තානායම |

1. CDBA  2. BDAC  3. CDAB  4. ADCB (............)

*** අංක 21 සිට 25 තෙක් ප්‍රශ්න වල හිස්තැන් වලට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.**

(21) ශ්‍රී ලංකාවේ මීටර් ............................ ට වැඩි බිම් වල ඇති තේ වගාව උඩරට තේ ලෙස සලකයි.

(22) කොළඹ, කුරුණෑගල, ................................ සම්බන්ධ කෙරෙන කලාපය පොල් ත්‍රිකෝණය ලෙස හැඳින්වේ.

(23) දකුණු ආසියාවේ අඩුම ජන ඝනත්වය ඇති රට ................................ යයි.

(24) 2012 ජන සංගණනයට අනුව ශ්‍රී ලංකාවේ ජන ඝනත්වය .............................. කි.

(25) උතුරු අත්ලාන්තික් සාගරයේ හටගන්නා සුළි සුළං ............................. නමින් හැඳින්වේ.

(26) ප්‍රස්ථාරයක රාමුව, මූලාශ්‍රය, සූචකය, පරිමානය හැරුණුවිට අත්‍යාවශයෙන්ම තිබිය යුතු මූලිකාංගය ............................. යි.

* පහත දැක්වෙන්නේ වර්ෂ 2015 වර්ෂයේ දී අනුරාධපුර දිස්ත්‍රික්කයට ලැබුණු සාමාන්‍ය උෂ්ණත්වය හා වර්ෂාපතන අගයන් දැක්වෙන ප්‍රස්ථාරයකි. එය අධ්‍යයනය කොට අංක 27 සිට 30 තෙක් ප්‍රශ්න වල හිස්තැනට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.




අනුරාධපුර දිස්ත්‍රික්කයේ මාසික සාමාන්‍ය උෂ්ණත්වය හා වර්ෂාපතන

(27) 2015 වර්ෂයේදී අඩුම වර්ෂාපතනයක් ලැබී ඇත්තේ ................................. මාසයේදීය.

(28) 2015 වර්ෂයේදී ඉහළම උෂ්ණත්වයක් වාර්තා වී ඇත්තේ ................................. මාසයේදීය.

(29) මෙම ප්‍රස්ථාරයේ වර්ෂාපතනය නිරූපණය කර ඇත්තේ ................................ ප්‍රස්ථාරයක් මගිනි.

(30) අනුරාධපුරයට ඉහළ වර්ෂාපතනයක් ලැබී ඇත්තේ .................................... මෝසම් වර්ෂා වර්ගය යටතේදීය.

*** අංක 31 සිට 40 තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු හතර අතුරෙන් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරා ඊට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.**

(31) ශ්‍රී ලංකාවේ වියළි කළාපයට පමණක් සීමා වූ පස් වර්ගය දැක්වෙන පිළිතුර තෝරන්න.
1. රතු කහ පොඩ්සොල් පස.
2. රතු දුඹුරු ලැටසොල් පස.
3. රතු - දුඹුරු පස.
4. දියළු පස (............)

(32) ආග්නේය පාෂාණ පමණක් ඇති පිළිතුර තෝරන්න.
1. ගැබ්රෝ, ජිප්සම්, ග්‍රැනයිට්.
2. ඩොලමයිට්, ග්‍රැනයිට්, ගැබ්රෝ.
3. ග්‍රැනයිට්, නයිස්, බැසෝල්ට්.
4. ග්‍රැනයිට්, බැසෝල්ට්, ගැබ්රෝ. (............)

(33) ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාත හැරුණු විට ඊලඟ විශාලම ජන සංඛ්‍යාව වෙසෙන පළාත වනුයේ,
1. මධ්‍යම පළාත.
2. දකුණු පළාත.
3. වයඹ පළාත.
4. සබරගමු පළාත. (............)

(34) ලෝක දේශගුණික වෙනස්කම් අධ්‍යයනය කිරීම හා උපදේශනයන් ලබාදීමට පිහිටුවා ඇති ජාත්‍යන්තර සංවිධානය කුමක්ද?
1. ලෝක කාලගුණික විද්‍යා සංවිධානය.
2. දේශගුණ විපර්යාස පිළිබඳ අන්තර්ජාතික මණ්ඩලය.
3. එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන.
4. ස්වභාවධර්මය සංරක්ෂණය කිරීමේ ජාත්‍යන්තර සංගමය.
(............)

*** පහත ප්‍රකාශ ඇසුරින් 35 සිට 37 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

A - ඇමර්සන් හා කොංගෝ වැනි වනාන්තර ව්‍යාප්තය.
B - මෝසම් දේශගුණය ද ක්‍රියාත්මකයි.
C - පැහැදිලි ශීත ඍතුවක් හා උණුසුම් ඍතුවක් ඇත.
D - මධ්‍යධරණී දේශගුණයද ක්‍රියාත්මකයි.
E - වාර්ෂික වර්ෂාපතනය 250 mm - 300 mm තරම් පහල අගයක් ගනී.
F - තුන්ද්‍රා දෙශගුණයද ක්‍රියාත්මකයි.

(35) ශීත දේශගුණයට අයත් ප්‍රකාශ නිවැරදිව ඇත්තේ,
1. B හා F 2. C හා F 3. D හා F 4. E හා F ලෙසයි. (............)

(36) සෞම්‍ය දේශගුණයකට ගැලපෙන ප්‍රකාශ අඩංගු අක්ෂර වනුයේ,
1. C හා D 2. C හා E 3. C හා F 4. C හා B ලෙසයි. (............)

(37) නිවර්ථන දේශගුණයකට ගැලපෙන නිවැරදි ප්‍රකාශ අඩංගු අක්ෂර වනුයේ,
1. A හා C 2. A හා B 3. B හා C 4. A හා D ලෙසයි. (............)

*** ප්‍රශ්න අංක 38 සිට 40 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම සඳහා පහත සඳහන් වගන්ති උපයෝගී කරගන්න.**

A - ග්‍රාමීය පොදු පසුකම් දියුණු කිරීම.
B - මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම.
C - ඇගලුම් කර්මාන්ත වැඩි දියුණු කිරීම.
D - සුළු අපනයන භෝග වැඩි දියුණු කිරීම.
E - ජනවාර්ගික සහජීවනයක් ගොඩනැංවීම.
F - අධ්‍යාපන සේවා සංවර්ධනය කිරීම.

(38) ශ්‍රී ලංකාවේ නගර වෙත සිදුවන ජන සංක්‍රමණය අවම කිරීමට ගතයුතු ක්‍රියාමර්ග ඇතුළත් වන්නේ,
1. A - B 2. D - E 3. B - D 4. B - C ලෙසයි. (............)

(39) ශ්‍රී ලංකාවේ අපනයන ආදායම ඉහළ නන්වා ගැනීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග වන්නේ,
1. A - D 2. B - C 3. C - D 4. D - F ලෙසයි. (............)

(40) සමාජ සංස්කෘතික සංවර්ධනයක් සඳහා වඩා වැදගත් ක්‍රියාමාර්ග වන්නේ,
1. A - F 2. C - E 3. A - E 4. E - F ලෙසයි. (............)

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

| 11 ශ්‍රේණිය | අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2018 | 61 S II |
|---|---|---|

## භූගෝල විද්‍යාව II

කාලය පැය 02 යි

**සැලකිය යුතුයි.**

* මෙම ප්‍රශ්න පත්‍රය I හා II වශයෙන් කොටස් දෙකකින් යුක්තය.
* I කොටසේ ප්‍රශ්නය අනිවාර්යය වේ. එහි (අ), (ආ), හා (ඉ) කොටස් තුනටම පිළිතුරු සැපයිය යුතුය.
* II කොටසින් ප්‍රශ්න හතරක් තෝරාගත යුතුය.
* පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

## I කොටස

ඔබ වෙත සපයා ඇති 1:50000 භූ ලක්ෂණ සිතියම අධ්‍යයනය කොට ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. පිළිතුරු දීම සඳහා ඔබ වෙත සපයා ඇති පිටු අංක 05 කඩදාසිය යොදාගන්න.

(01) (අ) අංක (i) සිට (iii) දක්වා ඇති ප්‍රශ්න වලට ගැලපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

i. සිතියමේ A - B ලෙස දක්වා ඇති භූ ලක්ෂණය කුමක්ද?
(උත්තල බෑවුම/ අවතල බෑවුම/ මොහොර බෑවුම) (ලකුණු 01)

ii. සිතියමේ C - D ලෙස දක්වා ඇති භූ ලක්ෂණය කුමක්ද?
(නෙරුව/ නිම්නය/ ගංගා නිම්නය) (ලකුණු 01)

iii. Z ලෙස දක්වා ඇති ත්‍රිකෝණ මිතික ස්ථානයේ උත්තාංශය විය හැක්කේ,
(340m/350m/360m) (ලකුණු 01)

iv. වෘත්තාකාර සිතියම් කොටස තුළ ඇති ජනාවාස රටාව කුමක්ද? (ලකුණු 01)

v. X ලක්ෂයේ මෙට්‍රික් කණ්ඩාංක අගය නිවැරදිව දක්වන්න. (ලකුණු 01)

vi. අංක 1 ලෙස දක්වා ඇති සිතියම් කොටස 3cm x 2cm ලෙස සලකා එහි වර්ගඵලය වර්ග කිලෝමීටර් වලින් දක්වන්න. (ලකුණු 01)

vii. අංක 02 හා 03 ලෙස පෙන්නුම් කරන වෘක්ෂලතා වර්ග දෙක අංක අනුව නම් කරන්න. (ලකුණු 01)

viii. අංක 04 ලෙස පෙන්වා දී ඇති පරිපාලන මායිම නම් කරන්න. (ලකුණු 01)

ix. Y ලක්ෂයේ සිටින පුද්ගලයෙකු වෘත්තාකාර කොටසේ ඇති ජනාවාස වෙත පැමිණෙන්නේ නම්,
a. ඔහු පසුකරන මාර්ග වර්ග තුනෙන් දෙකක් නම් කරන්න.
b. එම ගමන් මාර්ගයේදී හමුවන සේවා ස්ථාන දෙකක් නම් කරන්න. (ලකුණු 01+ 01)

ආ. ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම අධ්‍යයනය කර පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ලෝක සිතියමට යාබදව ඇති කොටස භාවිතා කරන්න.

i. A,B,C අක්ෂර අතුරින් **තායිවානය** දැක්වෙන අක්ෂරය කුමක්ද?
ii. D,E,F අක්ෂර අතුරින් **කැරිබියන්** මුහුද දැක්වෙන අක්ෂරය කුමක්ද?
iii. G,H,J අක්ෂර අතුරින් **ඇල්ප්ස් කඳු** දැක්වෙන අක්ෂරය කුමක්ද?
iv. K,L,M අක්ෂර අතුරින් **ටැංගනිකා විල** දැක්වෙන අක්ෂරය කුමක්ද?
v. PQR යන අක්ෂර අතුරින් **ක්‍රැකටෝවා** ගිනි කන්ද සඳහා යොදා ඇති අක්ෂරය කුමක්ද? (ලකුණු 05)

ඉ. ඔබ වෙත සපයා ඇති ලංකා සිතියම අධ්‍යයනය කර පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා සිතියමට යාබදව ඇති කොටස භාවිතා කරන්න.

i. A,B,C ලෙස ඇති දිස්ත්‍රික්ක අතුරින් **කෑගල්ල** දිස්ත්‍රික්කයට යෙදූ අක්ෂරය තෝරන්න.
ii. D,E,F යන අක්ෂර අතුරින් **කෙරවලපිටිය** තාප බලාගාරයට යොදා ඇති අක්ෂරය කුමක්ද?
iii. G,H,J යන අක්ෂර අතුරින් **"මහඔය"** සඳහා යොදා ඇති අක්ෂරය තෝරන්න.
iv. K,L,M යන අක්ෂර අතුරින් **රිටිගල දැඩි රක්ෂිතය** සඳහා යොදා ඇති අක්ෂරය තෝරන්න.
v. P,Q,R යන අක්ෂර අතුරින් **කච්චතිව් දූපත** සඳහා යොදා ඇති අක්ෂරය තෝරන්න. (ලකුණු 05)

## II කොටස

(02) පහත දක්වා ඇත්තේ පෘථිවියේ ජල චක්‍රයයි. එය හොඳින් අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.




i. ඉහත ජල චක්‍රයේ A, B, C හා D යන අවස්ථා අක්ෂර අනුව නම් කරන්න. (ලකුණු 02)

ii. ජල චක්‍රයේ "D" ක්‍රියාවලියට බලපාන පාරිසරික සාධක තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

iii. ලෝක ජල සම්පත වේගයෙන් දූෂණයට ලක්වෙමින් පවතී. ජල දූෂණයට හේතුවන මානව ක්‍රියාකාරකම් දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(03)




i. ඉහත ලෝක සිතියමේ අංක 01, 02, 03 හා 04 ලෙස දක්වා ඇති තිරිඟු ව්‍යාප්ත බිම් අයත් වන රටවල් අංක අනුව නම් කරන්න. (ලකුණු 02)

ii. තිරිඟු වගාව සාර්ථක වීමට බලපාන භෞතික සාධක තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

iii. අන්තර්ජාතික වෙළඳාමේදී ධාන්‍යයක් ලෙස තිරිඟු සඳහා ඉහළ ඉල්ලුමක් ඇතිවීමට හේතු වූ කරුණු දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(04) i. යකඩ හා වානේ නිෂ්පාදන කර්මාන්තයේ යෙදෙන ප්‍රමුඛපෙලේ ආසියාතික රටවල් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. "ලෝකයේ යකඩ හා වානේ නිෂ්පාදන ධාරිතාවය අඛණ්ඩව වර්ධනය වී ඇත." යකඩ සහ වානේ සඳහා ඉහළ ඉල්ලුමක් ඇතිවීමට හේතු වූ කරුණු තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

iii. ලෝක මෝටර් රථ කර්මාන්තයේ "පරිසර හිතකාමී මෝටර්රථ" නිෂ්පාදනයට දායක වූ අවස්ථා නිදසුන් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05)

(05) i. ශ්‍රී ලංකාවේ ඇතැම් ප්‍රදේශ විවිධ ගෘහ කර්මාන්ත සඳහා ප්‍රචලිත වී ඇත. හඳුනාගත් ගෘහ කර්මාන්ත දෙකක් හා එයට අදාළ ප්‍රදේශ සඳහන් කරන්න. (ලකුණු 02)

ii. ශ්‍රී ලංකාවේ ගෘහ කර්මාන්ත මුහුණ දෙන පොදු ගැටලු තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

iii. ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය දියුණු කිරීමෙන් ලැබිය හැකි ආර්ථික ප්‍රතිලාභයක් හා සමාජයීය ප්‍රතිලාභයක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(06) i. පහත දැක්වෙන්නේ ශ්‍රී ලංකා වෘක්ෂලතා ව්‍යාප්ත සිතියමකි. එහි A, B, C හා D යන වෘක්ෂලතා කලාප නම් කරන්න.




(ලකුණු 02)

ii. සිංහරාජ, දෙදියගල, කන්නෙලිය වැනි වන රක්ෂිත අයත් වනාන්තර වර්ගය නම් කොට එහි කැපී පෙනෙන ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.
(ලකුණු 03)

iii. වනාන්තර හා වනජීවී රක්ෂිත වලින් අපට ඇති පාරිසරික ප්‍රයෝජන තුනක් විස්තර කරන්න.
(ලකුණු 05)

(07) i. වර්ෂ 2015 වනවිට මහද්වීප හතරක ව්‍යාප්තව සිටි ජනසංඛ්‍යා ප්‍රතිශත, පහත වරහන් තුළ දක්වා ඇත. මහද්වීප අනුව එම ප්‍රතිශත නිවැරදිව ගලපා නැවත ලියන්න.

1. ආසියා මහද්වීපය -
2. අප්‍රිකා මහද්වීපය -
3. උතුරු ඇමරිකා මහද්වීපය -
4. යුරෝපා මහද්වීපය -

(8%, 10%, 16%, 60%) (ලකුණු 02)

ii. ලෝක ජන සංඛ්‍යාවේ අසම ව්‍යාප්තිය කෙරෙහි බලපෑ මානුෂ සාධක තුනක් නම් කරන්න.
(ලකුණු 03)

iii. ශ්‍රී ලංකා ජන සංඛ්‍යා ව්‍යුහයේ මෑත කාලීන කැපීපෙනෙන ලක්ෂණ දෙකක් කෙටියෙන් විස්තර කරන්න.
(ලකුණු 05)

(08) i. "තිරිසර සංවර්ධනය" යන්නෙන් කුමක් අදහස්වේ ද? (ලකුණු 02)

ii. රටක "මානව සම්පත් සංවර්ධනය" සඳහා මෑත කාලයේ ගෙන ඇති ක්‍රියා මාර්ග තුනක් සඳහන් කරන්න.
(ලකුණු 03)

ii. ශ්‍රී ලංකාවේ "නාගරික සංවර්ධනය" සඳහා මෑත කාලයේ ගෙන ඇති ක්‍රියා මාර්ග දෙකක් විස්තර කරන්න.
(ලකුණු 05)

***




1:50,000

සමෝච්ච රේඛා අන්තරය මීටර් 20
சம உயரக்கோட்டு இடைவெளி 20 மீற்றர்

01. (ආ) / ඔ / (ඉ)




| | |
|---|---|
| (I) | |
| (II) | |
| (III) | |
| (IV) | |
| (V) | |
| | 5 |

01. (ඉ) / ඔ / (c)




| | |
|---|---|
| (I) | |
| (II) | |
| (III) | |
| (IV) | |
| (V) | |
| | 5 |

## (61) භූගෝල විද්‍යාව II - (11 ශ්‍රේණිය - 2018)

(ආ) / ඉ / (ඉ)

| | පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා |
|---|---|
| (i) ........................................ | |
| (ii) ........................................ | |
| (iii) ........................................ | |
| (iv) ........................................ | |
| (v) ........................................ | |
| (vi) ........................................ | |
| (vii) (2) ........................................ | |
| (3) ........................................ | |
| (viii) ........................................ | |
| (xi) (a) ........................................ | |
| (b) ........................................ | |

**අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2018**
**භූගෝල විද්‍යාව - 11 ශ්‍රේණිය**
**පිළිතුරු පත්‍රය**

**I කොටස**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01. | කබොල | 11. | නිවැරදි | 21. | 1220 | 31. | 3 |
| 02. | $0.64^0C$ | 12. | වැරදි | 22. | හලාවත | 32. | 4 |
| 03. | දේශගුණය | 13. | නිවැරදි | 23. | භූතානය | 33. | 1 |
| 04. | යුරේසියානු | 14. | වැරදි | 24. | 323 | 34. | 2 |
| 05. | සෞම්‍ය | 15. | නිවැරදි | 25. | හරිකේන් | 35. | 4 |
| 06. | අතරමැදි | 16. | 2 | 26. | මාතෘකාව | 36. | 1 |
| 07. | කජු | 17. | 4 | 27. | ජූනි | 37. | 2 |
| 08. | සූර්යාලෝකය | 18. | 2 | 28. | අප්‍රේල් | 38. | 1 |
| 09. | ආග්නේය. | 19. | 2 | 29. | තීරු/ සරල තීරු | 39. | 3 |
| 10. | පහලවට තීරුවේ | 20. | 3 | 30. | ඊසාණදිග | 40. | 4 |

(ලකුණු 40යි)

**II කොටස**

(1) i. අවතල බෑවුම. ii. ගංගා නිම්නය.
iii. මීටර් 350 පමණ. iv. රේඛීය ජනාවාස
v. 195 Km E හා 280 Km N (E සහ N (දිශාව) සඳහන් නොකලේනම් ලකුණු දීමට නොහැකි වේ.)
vi. 1.5 $^2$Km vii. (02) - ලඳුකැළෑ, (03)- වනාන්තර viii. පළාත් මායිම.
ix. a - අඩි පාර/ ගුරු පාර (ජීප් රථ මාර්ගය) (කරත්ත පාර)/ සෙසු මාර්ගය (අප්‍රධාන මාර්ගය) මෙම මාර්ග වර්ග තුනෙන් දෙකක් සඳහන් කළ යුතුය.
b - පාසල/ උප තැපැල් කාර්යාලය (විහාරස්ථානය පිළිතුරක් නොවේ.) (ලකුණු 10යි)

ආ. i. C ii. F iii. H iv. L v. P (ලකුණු 05)
ඉ. i. A ii. E iii. J iv. L v. Q (ලකුණු 05)

(02) i. A - වාෂ්පීකරණය. C - කාන්දුවීම/වැස්සීම/රූරායාම
B - වර්ෂණය D - මතුපිට ගලායාම(අපධාවය) (1/2x4 =02)

ii. භූමියේ බෑවුම/ ජල ප්‍රමාණය/ මතුපිට පාෂාණ වල ස්වභාවය.
භූ විෂමතාවය/ පසේ ස්වභාවය/ වෘක්ෂලතා වැස්ම යනාදි ලක්ෂණ තුනක් (ලකුණු 03)

iii. *වනාන්තර ඉවත් කිරීම. *ගෘහස්ථ අපද්‍රව්‍ය ජලයට බැහැරකිරීම.
*කාර්මික අපද්‍රව්‍ය ජලයට මුසු කිරීම. *කෘෂි රසායනික ද්‍රව්‍ය, රසායනික පොහොර ජලයට එකතුවීම.
*මල අපවහන පද්ධති ජලයට එකතු වීම.
වැනි මානව ක්‍රියාකාරකම් දෙකක් විස්තර කිරීම. (2 1/2x2 =05)

(03) i. 1. චීනය 2. රුසියාව 3. කැනඩාව 4. ආර්ජන්ටිනාව (1/2x4 =02)
ii. 300,mm - 500mm අතර වර්ෂාපතනය.
තැනිතලා බිම්.
චර්නෝසම් පස.
පැළ වැඩෙන කාලයේ සිසිල් දේශගුණය.
අස්වනු නෙලන කාලයේ වියළි දේශගුණය. වැනි සාධක තුනක් සඳහා. (ලකුණු 03)
iii. * ලෝකයේ ඉහළම පරිභෝජනයක් ඇති ධාන්‍ය වීම.
* තිරිඟු පිටි විවිධ ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා භාවිතා කිරීම.
* තිරිඟු සත්ව ආහාර සඳහා භාවිතා කිරීම.
* තිරිඟු එතනෝල් නිෂ්පාදනයට ද භාවිතා කිරීම.
මෙවැනි කරුණු දෙකක් විස්තර කිරීම.

(04) i. චීනය/ ජපානය/ ඉන්දියාව/ දඃ කොරියාව යන රටවල් අතුරින් දෙකක් සඳහා ලකුණු දෙන්න.
(රුසියාව ආසියාතික රටක් නොවේ.)

ii. * කාර්මීකරණය ව්‍යාප්ත වීම. * යන්ත්‍රෝපකරණ නිෂ්පාදනය ඉහළ යාම.
* යකඩ වෙනත් ලෝහ නිෂ්පාදනයට භාවිතා කිරීම. * දැව වෙනුවට යකඩ භාවිතය පුළුල් වීම.
* ඉදිකිරීම් කර්මාන්තයේ වර්ධනය. * ප්‍රමිතිගත ගොඩනැගිලි ඉදිකිරීම බහුලවීම.
(මෙවැනි කරුණු තුනක් සඳහා ලකුණු 03යි)

iii. * දෙමුහුන් වාහන නිෂ්පාදනය. * විදුලිමය වාහන නිෂ්පාදනය.
* කුඩා සැහැල්ලු වාහන නිෂ්පාදනය. * ඉන්ධන පිරිමසන වාහන නිෂ්පාදනය.
* සූර්ය ශක්තියෙන් ක්‍රියාත්මක වන වාහන නිෂ්පාදනය.
(මෙවැනි කරුණු තුනක් සඳහා ලකුණු 05යි)

(05) i. පිත්තල භාණ්ඩ - පිළිමතලාව/ නත්තරම්පොත.
වේවැල් භාණ්ඩ - රදාවඩුන්න.
වෙස් මුහුණු - අම්බලංගොඩ.
ලී භාණ්ඩ - මොරටුව.
බීරළු හා රේන්ද - ගාල්ල/ කොග්ගල.
පැදුරු - දුම්බර
මෙවැනි තවත් ප්‍රදේශ ඇත්නම් සැලකිලිමත් වන්න. (ලකුණු 02)

ii. 10 පෙළපොත 132 පිටුව බලන්න.

iii. <u>ආර්ථික ප්‍රතිලාභ</u>
* විදේශ විනිමය ලැබීම.
* විවිධ සේවා සැපයීමෙන් ආදායම ඉහළ යාම. (වක්‍ර රැකියා)
* සෘජු රැකියා අවස්ථා උදාවීම.
* දේශීය ආහාර, පළතුරු, ඖෂධ වැනි ද්‍රව්‍ය සඳහා ඉල්ලුමක් නිර්මාණය වීම.
* අත්කම් භාණ්ඩ/ කලාකෘති/ විසිතුරු භාණ්ඩ සඳහා වෙළඳපලක් ලැබීම.

<u>සමාජයීය ප්‍රතිලාභ</u>
* ශ්‍රී ලංකාව ජාත්‍යන්තරව ප්‍රචලිත වීම.
* ලෝකයේ විවිධ සංස්කෘතීන් විඳීමට අවස්තාවක් ලැබීම.
* නව වටිනා සමාජ - සංස්කෘතික හරයන් ජන සමාජයට ලැබීම.
* ජාත්‍යන්තර අන්තර් යැපීම් වර්ධනය වීම.
* ජාත්‍යන්තර භාෂා වර්ධනයට හේතුවීම.

(06) i. A - වියළි මිශ්‍ර සදාහරිත වනාන්තර.
B - කටු පඳුරු සහ ලඳුකැළෑ.
C - අතරමැදි සදාහරිත වනාන්තර.
D - තෙත් කලාපීය වනාන්තර. (නිවර්තන වනාන්තර)

ii. නිවර්ථන තෙත්වනාන්තර, (විස්තරය 11 පෙළ පොත 35 - 36 පිටු)

iii. 11 පෙළපොත පිටුව 40.

(07) i. 1. ආසියා - 60% 3. යුරෝපා - 10%
2. අප්‍රිකා - 16% 4. උ. ඇමරිකා - 8% (ලකුණු 02)

ii. කාර්මික දියුණුව/ කෘෂිකාර්මික දියුණුව/ නාගරීකරණය/ වෙළඳ මධ්‍යස්ථාන පුළුල්වීම./ යටිතල පහසුකම් දියුණුවීම./ ඉහළ සමාජයීය හා සංස්කෘතික දියුණුව/ සංවර්ධිත ප්‍රදේශවීම./ ඉහළ සේවා පහසුකම් ස්ථාපිතවීම./ සමාජ සුරක්ෂිත භාවය දියුණු වීම.

iii. * වියපත් ජන සංඛ්‍යාව ඉහළ යාම. * ආයු අපේක්ෂාව ඉහළ යාම.
* උපත් අනුපාතිකය පහළ යාම. * පුම්තිරි අනුපාතිකය පහළ යාම.
* මරණ අනුපාතිකය පහළ යාම. * ශ්‍රමික පිරිසේ ප්‍රතිශතය ඉහළ යාම
වැනි කරුණු දෙකක් විස්තර කිරීම.

(08) i. "පරිසරයේ ඇති ස්වභාවික සම්පත් අනාගත පරපුරට පරිහරණය කිරීමට ඇති හැකියාව තහවුරු කරමින් සිදුකරන සංවර්ධනය - තිරසාර සංවර්ධනයයි."

"පරිසර සම්පත් සුරක්ෂිත කරමින් සිදුකරන සංවර්ධනය - තිරසාර සංවර්ධනයයි."
මෙවැනි නිර්වචනයක් සඳහා ලකුණු දෙන්න.

ii. * අධ්‍යාපනය පුලුල් කිරීම හා සැමට අවස්ථාව ලබාදීම.
* සෞඛ්‍ය සේවා පුළුල් කිරීම තුළින් නිරෝගි ජනතාවක් බිහි කිරීම.
* සමාජ ආරක්ෂාව තහවුරු කිරීම.
* මානව අයිතිවාසිකම් ශක්තිමත් කිරීම.
* ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ තහවුරු කිරීම.
* අධ්‍යාත්මික ගුණවගාවක් ඇති කිරීම. (මෙවැනි කරුණු 03ක්)

iii. පෙළපොත 11 - පිටුව 80.